## දෙවන ප්‍රජා ජල සම්පාදන හා සනිපාරක්ෂක ව්‍යාපෘතිය ඇවර කිරීම - 2011 ජුනි 30

1. මතය
------

මෙම වාර්තාවේ 3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, දෙවන ප්‍රජා ජල සම්පාදන හා සනිපාරක්ෂක ව්‍යාපෘතියේ ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන වලින් 2011 ජුනි 30 දිනට එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් පවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මූල්‍ය කාර්යය සාධනය

(අ) මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකිවූ තොරතුරු වලට අනුව, 2011 ජුනි 30 ව්‍යාපෘතිය අවසන් වන දිනට ව්‍යාපෘතියේ සමුච්චිත වියදම පහත සඳහන් පරිදි විය.

| විස්තරය | 2011 ජුනි 30 දිනට සමුච්චිත වියදම |
|---|---|
| | රු '000 |
| සිවිල් වැඩ | 4,953,805 |
| ස්ථාවර වත්කම් | 113,720 |
| උපදේශක සේවා | 1,216,512 |
| පුහුණු | 149,920 |
| ව්‍යාපෘති කළමනාකරණය | 373,126 |
| | 6,807,083 |
| | ========= |

(ආ) 2011 ජුනි 30 දින දක්වා ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ව්‍යාපෘතිය වෙත අරමුදල් නිදහස් කිරීම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| විස්තරය | වෙන්කළ ප්‍රමාණය | නිදහස් කළ ප්‍රමාණය |
|---|---|---|
| | එස් ඩී ආර් | එස් ඩී ආර් |
| සිවිල් වැඩ | 16,010,000 | 16,443,027 |
| ස්ථාවර වත්කම් | 550,000 | 552,659 |
| උපදේශක සේවා | 5,990,000 | 5,698,993 |
| පුහුණු | 870,000 | 634,318 |
| ව්‍යාපෘති කළමනාකරණය | 370,000 | 406,727 |
| | 23,790,000 | 23,735,724 |
| | ======== | ======== |

2011 ජුනි 30 දින ව්‍යාපෘතිය අවසාන වන විට අරමුදල් භාවිතය 99% ක් වුවද, උපදේශක සේවා හා පුහුණු සඳහා අරමුදල් භාවිතය පිළිවෙලින් 95% ක් හා 72% ක් විය.

(ඇ) 2011 ජුනි 30 දිනෙන් අවසන් වන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය පහත සඳහන් පරිදි විය.

| විස්තරය | ජාත්‍යන්තර සංවර්ධන සංගමය | ශ්‍රී ලංකා රජය | පළාත් සභා හා ප්‍රාදේශීය සභා | ප්‍රජාව | එකතුව |
|---|---|---|---|---|---|
| එකගවූ දායකය (රු මිලියන) | 3,186 | 715 | 350 | 1,475 | 5,726 |
| 2011 ජුනි 30 දිනට සමුච්චිත තථ්‍ය දායකය (රු මිලියන) | 4,002 | 655 | 323 | 1,827 | 6,807 |
| අරමුදල් උපයෝජනය ප්‍රතිශතයක් ලෙස | 126% | 92% | 92% | 124% | 119% |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2009 ජුනි මස අවසානයට ව්‍යාපෘතියේ කටයුතු නිමකළ යුතුව තිබුණු අතර ව්‍යාපෘති කාලය 2011 ජුනි 30 දින දක්වා දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතිය අවසාන වන විට ජාත්‍යන්තර සංවර්ධන සංගමය හා ශ්‍රී ලංකා රජය පිළිවෙලින් රු මිලියන 4,002 ක් හා රු මිලියන 655 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර තිබුණි. පළාත් සභා හා ප්‍රාදේශීය සභාද රු මිලියන 323 ක ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. කෙසේ වුවත් ඉදිකිරීම් පිරිවැය අනුව පළාත් සභා හා ප්‍රාදේශිය සභා වෙනුවෙන් එකග වූ දායකය රු. මිලියන 445 ක් විය යුතු වුවද, සත්‍ය දායකත්වය රු මිලියන 323 ක පහල අගයක් ගෙන තිබුණි.

එමෙන්ම අම්පාර හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාල වලට අදාල ඉදිකිරීම් සම්බන්ධව ප්‍රාදේශිය සභා විසින් කිසිදු දායකත්ව මුදලක් යොදවා නොතිබුණු අතර ත්‍රිකුණාමලය දිස්ත්‍රිකයේ හා මධ්‍යම පළාත් වතු අංශයට අදාලව ප්‍රජා මූල සංවිධාන වල ප්‍රජා දායකත්වය පිළිවෙලින් සයයට 17 ක් හා සයයට 13 ක අඩු අගයන් ගෙන තිබුණි.

(ii) ව්‍යාපෘතියේ උපදේශක සේවා හා පුහුණු වියදම් සඳහා ජාත්‍යන්තර සංගමය විසින් සළසා තිබුණු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් එකතුව එ.ජ.ඩොලර් මිලියන 1.07ක් භාවිතා කර නොතිබූ අතර එය ඇස්තමේන්තු ගත මුදලින් 10% ක් විය. එමෙන්ම මෙහෙයුම් වියදම් ඇස්තමේන්තුව වන එ.ජ.ඩොලර් මිලියන 0.03 ක ප්‍රතිපාදනය ඉක්මවා යාම නිසා 2008 වර්ෂයේ සිට ව්‍යාපෘතිය අවසාන වන තෙක් රු 89,884,135 ක මෙහෙයුම් වියදම් දේශිය අරමුදලින් පියවා තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් රු. මිලියන 2.32 ක භාණ්ඩ මිලදී ගැනීම් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

## 3. විගණන නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.1 භෞතික ප්‍රගතිය

(අ) ජල සැපයුම් ව්‍යාපෘති

කාණ්ඩ I , II , III හා IV අදාලව 2011 ජුනි 30 දිනට භෞතික ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

| පළාත | අනුමත ව්‍යාපෘති ඒකක | ක්‍රියාත්මක ව්‍යාපෘති ඒකක | අත්හිටවූ ව්‍යාපෘති ඒකක | නිමනොකල ව්‍යාපෘති ඒකක |
|---|---|---|---|---|
| මධ්‍යම | 502 | 469 | 33 | 18 |
| මධ්‍යම-වතු | 09 | 09 | - | - |
| වයඹ | 264 | 256 | 08 | - |
| නැගෙනහිර | | | | |
| ත්‍රිකුණාමලය | 24 | 14 | 10 | 04 |
| අම්පාර | 41 | 30 | 11 | - |
| | 840 | 778 | 62 | 22 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතියට අදාල සියළුම ජල සැපයුම් ව්‍යාපෘති 2011 ජුනි 30 දින වන විට අවසන් විය යුතු වුවත්, 2011 ජුනි 30 දිනට පැවති ව්‍යාපෘති වාර්තා අනුව මධ්‍යම පළාතට අදාලව උප ව්‍යාපෘති 18 ක්ද , නැගෙනහිර පළාතට අදාලව උපව්‍යාපෘති 04 ක්ද නිමකර නොතිබුණි. මෙම නිම නොවූ ව්‍යාපෘති 22 සඳහා රු. මිලයන 95.68 ක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි.

(ii) උක්ත කාණ්ඩ වලට අදාලව ලබාගත හැකිවූ තොරතුරු අනුව උපව්‍යාපෘති 62 ක් ජල මූලාශ්‍ර නොමැතිවීම, ප්‍රජා සහභාගිත්වයක් නොමැතිවීම, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් පවරා ගැනීම යනාදී හේතූන් මත අත්හැර දමා තිබුණි. මෙම ව්‍යාපෘති සඳහා රු. මිලියන 33.23 ක මූලික වියදම් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි.

තවද, මෙම ව්‍යාපෘති අත්හැරීම මත නිවාස ලාභීන් 37,115 ක් සඳහා ජල සැපයුම් පද්ධති අහිමිවී තිබුණි.

3.2 සනිපාරක්ෂක වැඩසටහන

ව්‍යාපෘතියේ I , II , III හා IV කාණ්ඩ යටතේ වැසිකිලි ඒකක 55,581ක් වැඩි දියුණු කිරීමට සැලසුම් කර තිබුණද, 2011 ජුනි 30 දිනට ඒකක 54,490 ක් පමණක් නිම කර තිබුණි. සනීපාරක්ෂක වැඩසටහනෙහි වූ ප්‍රගතිය පහත දැක්වේ.

| පළාත/දිස්ත්‍රික්කය | සනිපාරක්ෂක අවශ්‍යතාවය | නිමකල වැසිකිලි සංඛ්‍යාව | ඉටුකර ගැනීමේ ප්‍රගතිය | යෙදවු මුදල |
|---|---|---|---|---|
| | ඒකක | ඒකක | % | රු මි |
| මධ්‍යම පළාත | 34,588 | 38,688 | 112 | 54.68 |
| වයඹ පළාත | 9,722 | 10,783 | 111 | 13.78 |
| ත්‍රිකුණාමලය | 7,237 | 2,236 | 31 | 16.37 |
| අම්පාර | 3,234 | 2,472 | 76 | 8.78 |
| වතු අංශය | 800 | 311 | 39 | 1.20 |
| | 55,581 | 54,490 | 98 | 94.81 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සනීපාරක්ෂක වැඩ සටහන යටතේ වූ රු.මිලියන 94.81 ක් ප්‍රජා මූල සංවිධාන හරහා ව්‍යාපාතිය ආරම්භයේ සිට 2011 ජුනි 30 දිනට ප්‍රතිලාභීන්ට ලබාදී තිබූ අතර එම වටිනාකම ආපසු අයකර ගැනීම් චක්‍රිය අරමුදල මගින් සිදු කළ යුතුය. කෙසේ වුවද ප්‍රජා මුල සංවිධාන විසින් මෙම අරමුදල් නිසි පරිද ආපසු අයකර ගැනීමට අපොහොසත්වීම මත හා සනිපාරක්ෂක වැඩසටහන සඳහා ලැබූ මුදල් ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කිරීම මත ඉලක්ක ගත වැසිකිලි ප්‍රමාණය සම්පූර්ණ කිරීමට නොහැකිවී තිබුණි.

(ii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාලය සඳහා සනීපාරක්ෂක කටයුතු වෙනුවෙන් රු මිලියන 16.37 ක් ව්‍යාපෘතිය විසින් ලබාදී තිබුණද, 2011 ජුනි 30 දිනට එහි ප්‍රගතිය සයයට 31 ක අඩු අගයක් ගෙන තිබුණි.

(iii) වතු අංශයේ සනීපාරක්ෂක කටයුතු වල භෞතික ප්‍රගතිය සයයට 39 ක් වූ අතර වතු කළමනාකරණ දායකත්වය ප්‍රමාණවත් පරිදි නොලැබීම වතු අංශයේ සනීපාරක්ෂක වැඩසටහන් අපේක්ෂිත පරිදි කාර්යක්ෂමව ක්‍රියාත්මක නොවීමට හේතු වී තිබුණි.

3.3 ව්‍යාපෘතියේ වත්කම්

(අ) ව්‍යාපෘතිය සතුව පැවති රු 113,719,788 ක් වටිනා ස්ථාවර වත්කම් වලින් 82% ක් ප්‍රධාන වශයෙන් පළාත් සහා යටතේ පිහිටුවා තිබූ උප ව්‍යාපෘති අංශයන් වෙත නිකුත් කර තිබූ අතර ඉතිරියෙන් 17% ක් රේඛීය අමාත්‍යාංශය හා 1% ක් රජයේ ආයතන කිහිපයකට පවරා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උක්ත වත්කම් පැවරීම සම්බන්ධයෙන් අදාල ආයතන වලින් ලබාගත් සනාථ කිරීම් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) පළාත් සභා යටතේ පිහිටුවා තිබූ උප ව්‍යාපෘති සඳහා මෙම වත්කම් පැවරීමේ අරමුණ වූයේ ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා වුවත්, ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව අරමුණු ඉටුවී නොමැති බව අනාවරණය විය.

(ආ) සිවිල් වැඩ, උපදේශක සේවා, පුහුණු කටයුතු සහ ව්‍යාපෘති කළමනාකරණය වෙනුවෙන් දරන ලද රු මිලියන 6,693.36 ක් වූ සමුච්චිත වියදම් නිසි පරිදි හඳුනා ගෙන අදාල ව්‍යාපෘති ප්‍රතිලාභීන් හට අන්තර් ග්‍රහණය කර නොතිබුණි.

3.4 <u>ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම</u>

ප්‍රජාවගේ පිරිසිදු පානීය ජල අවශ්‍යතා සපුරාලීම, ප්‍රමාණවත් සනීපාරක්ෂක හා සෞඛ්‍යමය පහසුකම් මූලික කරගෙන පිහිටුවන ලද ව්‍යාපෘතියේ කටයුතු 2011 ජුනි 30 දිනෙන් අවසන් වන විට ලැබූ ප්‍රගතිය ව්‍යාපෘති ගිවිසුම හා ව්‍යාපෘති වාර්තා වලට අනුව පහත සඳහන් පරිදි විය.

| විස්තරය | ව්‍යාපෘති ගිවිසුම අනුව | ව්‍යාපෘති අවසන් වාර්තාව අනුව | ඉටුකර ගැනීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ප්‍රතිලාභ ලබන පවුල් ඒකක ගණන | 220,000 (මධ්‍යම හා වයඹ පළාත) | 171,341 (මධ්‍යම,වයඹ,උතුරු හා නැගෙනහිර පළාත) | 78% |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1,230,000 | 719,700 | 58% |
| ජල සැපයුම් ව්‍යාපෘති | | | |
| - Pipe borne gravity Scheme | 41% | 18% | 44% |
| - Pipe borne pumping scheme | 25% | 78% | 312% |
| - Common dug well | 21% | 0.5% | 2% |
| - Deep wells with hand pumping | 8% | 0.3% | 4% |
| - Rain harvesting | 5% | 3.2% | 64% |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජල සැපයුම් ප්‍රතිලාභීන් සංඛ්‍යාව හා ප්‍රතිලාභ ලබන පවුල් ඒකක ගණන පිළිවෙලින් 58% ක් හා 78% ක අඩු අගයක් ගෙන තිබුණි.

(ආ) ජල සැපයුම් ව්‍යාපෘති ජල මූලාශ්‍ර අනුව ඉටුකර ගැනීමේ ප්‍රගතිය නල ජල පද්ධති (Pipe borne Pumping) හැර අනෙකුත් මූලාශ්‍ර ඉතා පහල අගයක පැවතුණි.

(ඇ) ව්‍යාපෘති ගිවිසුමේ ජේද අංක 10 (අ) අනුව ව්‍යාපෘතියේ අරමුණ වන "ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවගේ ජලය සහ සනීපාරක්ෂක සේවා භාවිතය කාර්යක්ෂමව සහ අඛණ්ඩව පවත්වා ගෙන යන්නේද"යන්න ඇගයීම සඳහා ව්‍යාපෘති කාලයෙන් පසු මිණුම් දර්ශක 05 ක් හඳුන්වා දී ඇතත් ව්‍යාපෘතිය අවසන්වීමෙන් පසු එම මිණුම් පිළිබඳ සමීක්ෂණයක් හෝ අධීක්ෂණයක් සිදු කර නොතිබුණි. එබැවින් ව්‍යාපෘතියේ අරමුණු අපේක්ෂිත අයුරින් ඉටු වූයේද යන්න ඇගයීම ගැටළු සහගත විය.

3.5 ව්‍යාපෘතියේ පැවැත්ම

ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු පවත්වා ගෙන යාම සඳහා 2011 දෙසැම්බර් 30 දින පිහිටවූ ජාතික ප්‍රජා ජල භාරය විසින් 2012 වර්ෂයේදී ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව ඒ ඒ ප්‍රාදේශීය සභා විසින් ගිවිසුම් ගත සයයට 5 ක දායකත්වය නිසි පරිදි ලබාදී නොතිබීම , ජල ව්‍යාපෘති වල පසු කාලීනව ජල මූලාශ්‍ර සිදී යාම, ජලයේ ගුණාත්මක භාවය වෙනස් වීම, තාක්ෂණක ගැටළු සහ විශාල ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් සඳහා ජලය සැපයීම, නියමිත ව්‍යාපෘති වල ආරක්ෂාව සහ පැවැත්ම තහවුරුකිරීමට ඒ ඒ ප්‍රජා මූල සංවිධාන අපොහොසත් වීම යනාදී හේතු මත ව්‍යාපෘතියේ කටයුතු තවදුරටත් පවත්වා ගෙන යාම දුෂ්කරවී තබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘති වල නැවත ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා
රු මිලියන 285.90 ක් පමණ වැය වෙතැයි ඇස්තමේන්තුකර තිබුණි.

තවද, ව්‍යාපෘතිය යටතේ පිහිටුවා තිබූ ප්‍රජා මූල සංවිධානවලට ප්‍රජා ජල භාරය යටතේ ලියාපදිංචි වන ලෙස ඉල්ලීමක් කර තිබුණද, ප්‍රජා මූල සංවිධාන බිඳ වැටීම හේතුවෙන් ලියාපදිංචිය අවම මට්ටමක පවතින බව එම සංවිධානය විසින් තවදුරටත් සඳහන් කර තිබුණි.

ඊඑච්ඩී/II සීඩබ්ලිව්එස්එස්පී
එල් අයි කිව්යු/ 2011/ඒසීසීටී

2013 අප්‍රේල් දින

ලේකම්,

ජල සම්පාදන හා ජලපවාහන අමාත්‍යාංශය

**දෙවන ප්‍රජා ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘතියෙ**
**2011 ජුනි 30 දිනෙන් අවසන් ව්‍යාපෘතිය ඇවර කිරීමේ**
**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාවේ කෙටුම්පත මේ සමග එවා ඇත.

02 එම වාර්තාවේ සාවද්‍ය,එකගවිය නොහැකි හෝ ප්‍රසිද්ධ කිරීම මහජන යහපතට පටහැනි වන්නේ යැයි අදහස් කරන කරුණු කිසිවක් වේ නම් මෙම ලිපියේ දින සිට දින 07 ක් ඇතුලත මා වෙත දන්වන්නේ නම් මැනවි.

03 ඉහත සඳහන් පරිදි දින 07 ක් ඇතුලත ඔබගෙන් පිළිතුරක් නොලැබුන හොත් කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන අවසන් වාර්තාව නිකුත් කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

ඩබ්ලිව් පි සී වික්‍රමරත්න
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ඊඑච්පී/II සීඩබ්ලිව්එස්එස්පී/ 2011/එෆ්ඒ

2013 අගෝස්තු දින

ලේකම්,
ජල සම්පාදන හා ජලපවාහන අමාත්‍යාංශය

**<u>දෙවන ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2011 ජුනි 30 දිනෙන් අවසන් අර්ධ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව</u>**

සමාංක හා 2013 ජුනි 15 දිනැති මාගේ ලිපියට යොමුවේ.

යථෝක්ත වාර්තාවේ ඉංග්‍රීසි අනුවාදය මේ සමග එවා ඇත.

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

**පිටපත - ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය**

ටීඑච්සී/IIසීඩබ්ලිව්එස්එස්පී/ 2011/එෆ්ඒ

2013 ජූනි දින

ලේකම්,

ජලසම්පාදන හා ජලපවාහන අමාත්‍යාංශය

**දෙවන ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2011 ජූනි 30 දිනෙන් අවසන් ව්‍යාපෘතිය ඇවර කිරීමේ ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව**

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච් ඒ එස් සමරවීර

විගණකාධිපති

පිටපත - ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය